JMC vLearning
"your virtual learning partner"

# මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

රුක්මල් විජේකෝන්

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

මේ වන විට අප විසින් ශේෂ පිරික්සුම පිළියෙල කිරීම සහ ගැලපුම් සටහන් පිළිබඳ මනා අවබෝධයක් ලබාගෙන ඇත.

ගිණුම්කරණ ක්‍රියාවලියේ අවසන් පියවර වන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමයි. දැන් අප පිවිසෙන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අධ්‍යනය කිරීම සඳහා ය.

මූල්‍ය ප්‍රකාශවල පරමාර්ථය - **Purpose of Financial Statements**

මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථය වනුයේ, **ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය කාර්යසාධනය හා මුදල් ප්‍රවහයන් පිළිබඳ පුළුල් පරාසයක තොරතුරු** ආර්ථික තීරණ ගැනීමට අපේක්ෂාවෙන් සිටින පරිශීලකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සැපයීමයි.

ඒ අනුව මූල්‍ය ප්‍රකාශ වලින් පහත තොරතුරු ඉදිරිපත් කෙරේ.

| | |
|---|---|
| (a) වත්කම් | Assets |
| (b) වගකීම් | Liabilities |
| (c) හිමිකම් | Equity |
| (d) අදායම් හා වියදම් ලාභ හා අලාභ ඇතුළුව Gains and Losses | Income and Expenses, Including |
| (e) වෙනත් හිමිකම් වෙනස් වීම් | Other Changes in Equity |
| (f) මුදල් ප්‍රවහයන් | Cash Flows |

ශ්‍රී.ලං.ගි. ප්‍රමිත අංක 01 (LKAS - 01), මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක පහත අයිතම අන්තර්ගත විය යුතුය. ඒවා මූල්‍ය ප්‍රකාශන වල උපාංග ලෙසද හඳුන්වනු ලබයි.

1. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය (Income Statement)
   ආදායම් ප්‍රකාශයට පහත ගිණුම් ඇතුලත් වේ.
   - නිෂ්පාදන ගිණුම (නිෂ්පාදන ව්‍යාපාරයක් නම් පමණි)
   - වෙළෙඳ ගිණුම
   - ලාභලාභ ගිණුම
2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (Statement of Financial Position)
3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය (Cash Flow Statement)
4. ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය (Statement of Changes in Equity)
5. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ විස්තරාත්මක සටහන්(Accounting Policies and Explanatory Notes)

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන කට්ටලයම පිළියෙල කළ යුතු වන්නේ සමාගම් විසින් පමණි. හවුල් ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර ගිණුම් පිළියෙල කිරීම අනිවාර්යය නොවේ.

කෙසේ වෙතත් තීරණ ගැනීමේ පහසුව වෙනුවෙන් බොහෝ තනි ව්‍යාපාර ඉහත පළමු ප්‍රකාශන 2 වත් පිළියෙල කරනු ලබයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

AAT පදනම් අදියරේ දී අප සාකච්ඡා කරනු ලබන්නේ තනි පුද්ගල ව්‍යාපාරයක (කේවල ස්වාමි ව්‍යාපාරයක) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ආකාරය පිළිබඳව පමණි. තනි පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුළ පහත ප්‍රකාශන අන්තර්ගත වේ.

දැන් අපි ඉහත ප්‍රකාශන පිළියෙල කරන ආකාරය අධ්‍යයනය කරමු.

1. ආදායම් ප්‍රකාශය
   - නිෂ්පාදන ගිණුම
   - වෙළෙඳ හා ලාභලාභ ගිණුම
2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

## වෙළඳ සහ ලාභාලාභ ගිණුම / විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## Trade and Profit & Loss Account/Comprehensive Income Statement

### වෙළෙඳ ගිණුම

### Trade Account

''භාණ්ඩ අලෙවි කිරීමෙන් ලද ලාභය ගණනය කිරීමට පිළියෙල කරනු ලබන ගිණුම වෙළෙඳ ගිණුමයි. නැතහොත් ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකමෙන් ජනිත වූ ලාභය ගණනය කිරීමට පිළියෙල කරන ගිණුම වෙළෙඳ ගිණුම ලෙස ද හැඳින්විය හැකිය. මෙම ලාභය දළ ලාභය (Gross Profit) ලෙස හඳුන්වයි.''

වෙළෙඳ ගිණුමක ආකෘතිය පහත පරිදි දැක්විය හැකිය.

**--------------- මහතාගේ ව්‍යාපාරයේ**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ ගිණුම**

| | | |
|---|---|---|
| විකුණුම් | XXX | |
| (-) ආපසු එවුම් | (XX) | XXX |
| **එකතු කළා** | | |
| ගැණුම් | XXX | |
| නිෂ්පාදන පිරිවැය | XXX | |
| ගෙන ඒමේ කුලි | XX | |
| පැටවුම් කුලි | XX | |
| බෑමේ කුලි | XX | |
| | XXX | |
| අඩු කළා | | |
| ආපසු යැවුම් | (XXX) | (XXX) |
| | | XXX |

JMC vLearning "your virtual learning partner"

| | | |
|---|---|---|
| භාණ්ඩ ගැනිලි | (XXX) | |
| භාණ්ඩ පරිත්‍යාග | (XXX) | |
| විනාශ වූ තොග | (XXX) | (XXX) |
| | | XXX |
| අඩු කළා: | | |
| අවසන් තොගය | | XXX |
| විකුණුම් පිරිවැය | | XXX |
| දළ ලාභය | | XXX |
| | | XXX |

## උදාහරණ -

උදය මහතාගේ ව්‍යාපාරයේ පහත සඳහන් තොරතුරු ඇසුරින් වෙළඳ ගිණුමක් පිළියෙල කර දළ ලාභය ගණනය කරන්න.

| | රු: |
|---|---|
| 2018/01/01 දින **ඉතිරි බඩු තොගය** | 36,750 |
| **ගැණුම්** | 199,770 |
| **විකුණුම්** | 385,270 |
| **ආපසු එවුම්** | 2,320 |
| **ආපසු යැවුම්** | 1,670 |
| **භාණ්ඩ ගෙන ඒමේ කුල** | 5,420 |
| **ආනයන තීරු බදු** | 3,200 |
| **ගුදම් ගාස්තු** | 1,400 |
| **පැටවීමේ හා බෑමේ කුලී** | 5,400 |
| **භාණ්ඩ ගැනිලි** | 2,410 |
| **විනාශ වූ තොග** | 3,000 |
| 2018/12/31 දින **ඉතිරි බඩු තොගය** | 44,910 |

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ලාභාලාභ ගිණුම

## Profit & Loss Account

"වෙළෙඳ ගිණුමෙන් දළ ලාභය ගණනය කළ පසු ව්‍යාපාරයේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුවම අදාල නොවන, නමුත් ආදායම් ඉපයීමට දායක වූ අනෙකුත් වියදම් ගලපා ශුද්ධ ලාභය (Net Profit) ගණනය කිරීම සඳහා ලාභාලාභ ගිණුම පිළියෙල කරනු ලබයි."

ලාභාලාභ ගිණුමේ වියදම් වාර්තා කරන විට එම වියදම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ වර්ග කොට දැක්වීම තීරණ ගැනීමට ඉතා වැදගත් වේ.

i. විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

ii. පරිපාලන වියදම්

iii. මූල්‍ය වියදම්

iv. වෙනත් වියදම්

- විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

  Sales and Distribution Expenses

  ව්‍යාපාරයේ භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධයෙන් දැරූ වියදම් මේ ශීර්ෂය යටතේ දක්වන්න.

  උදා: ප්‍රචාරණය හා අලෙවි ප්‍රවර්ධන වියදම්
  විකුණුම් සේවක වේතන
  බොල් ණය
  දුන් වට්ටම්

- පරිපාලන වියදම්

  Administration Expenses

  ව්‍යාපාරයේ පරිපාලන ක්‍රියාකාරකම් වෙනුවෙන් දරනු ලැබූ වියදම් මේ ශීර්ෂය යටතේ දක්වන්න.

  උදා: කාර්යාල සේවක වේතන
  කළමනාකරණ වේතන (විකුණුම් කළමනාකරුවන් හැර)
  දුරකථන ගාස්තු
  වරිපනම්
  විදුලිය

- මූල්‍ය වියදම්

  Finance Expenses

  ව්‍යාපාරයට අරමුදල් රැස් කිරීම වෙනුවෙන් දැරූ පිරිවැයක් මේ යටතට ගන්න.

  උදා: බැංකු ණය පොළී
  අයිරා පොළී, බැංකු ගාස්තු


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- වෙනත් වියදම්

  Other Expenses

  ඉහත කුමන ශීර්ෂයක් යටතේ හෝ ඇතුලත් කළ නොහැකි වියදම් මේ යටතේ දක්වන්න.

  උදා: තොග හානි අලාභ, තොගය ශූ.උ.අ. තෙක් කපා හැරීම්

**වෙළෙඳ ගිණුම හා ලාභලාභ ගිණුම වෙන වෙනම පිළියෙල නොකොට, තනි ගිණුමක් ලෙස පිළියෙල කරනු ලබයි. මේ සඳහා පහත සඳහන් ආකෘතින් යොදා ගන්න. භාවිතයේ පවතින්නේ සිරස් ආකෘතිය බැවින් එම ආකෘතිය දිගින් දිගටම භාවිතා කරන්න.**

**සිරස් ආකෘතිය**

............. **ව්‍යාපාරයේ**

2019.03.31 **දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | XXX | |
| **අඩු කළා:** | | | |
| ආපසු එවුම් | | (XXX) | |
| ශුද්ධ විකුණුම් | | | XXX |
| **අඩු කළා:** | | | |
| **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොගය | | XXX | |
| **එකතු කළා:** | | | |
| ගැණුම් | XXX | | |
| නිෂ්පාදන පිරිවැය | XXX | | |
| ගෙන ඒමේ කුලි | XXX | | |
| ආයාත තීරු ගාස්තු | XX | | |
| පැටවුම් කුලී | XX | | |
| | XXX | | |
| **අඩු කළා:** | | | |
| ආපසු යැවුම් | (XX) | XXX | |
| | | XXX | |
| භාණ්ඩ ගැනිලි | (XX) | | |
| භාණ්ඩ පරිත්‍යාග | (XX) | | |
| විනාශ වූ තොග | (XX) | (XX) | |
| | | XXX | |
| **අඩු කළා:** | | | |

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | | |
|---|---|---|---|
| අවසන් තොගය | | XXX | (XXX) |
| දළ ලාභය | | | XXX |
| **එකතු කළා:** | | | |
| **වෙනත් ආදායම්** | | | |
| පොළී ආදායම | | XXX | |
| ලාභාංශ ආදායම | | XXX | |
| වත්කම් විකිණීමේ ලාභ | | XXX | XXX |
| | | | XXX |
| **අඩු කළා:** | | | |
| **විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්** | | | |
| ප්‍රචාරණය | | XXX | |
| විකුණුම් සේවක වේතන | | XXX | |
| බොල් ණය | | XXX | |
| දුන් වට්ටම් | | XXX | (XXX) |
| | | | |
| **පරිපාලන වියදම්** | | | |
| කාර්යාල සේවක වේතන | | XXX | |
| කළමනාකරණ වේතන | | XXX | |
| දුරකථන ගාස්තු | | XXX | |
| වරිපනම් | | XXX | |
| විදුලිය | | XXX | (XXX) |
| | | | |
| **මූල්‍ය වියදම** | | | |
| බැංකු ගාස්තු | | XXX | |
| අයිරා පොළී | | XXX | |
| හර බදු | | XXX | (XXX) |
| | | | |
| **වෙනත් වියදම්** | | | |
| තොග හානි අලාභ | | XXX | |
| තොගය ශු:උ:අ: තෙක් කපාහැරීම | | XXX | (XXX) |
| **ශුද්ධ ලාභය / අලාභය** | | | **XXX** |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### උදාහරණ

කිත්සිරි මහතාගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ පහත දැක්වෙන තොරතුරු ඇසුරින් ලාභාලාභ ගිණුමක් පිළියෙල කර ශුද්ධ ලාභය ගණනය කරන්න.

| | රු: |
|---|---|
| වර්ෂයේ දළ ලාභය | 800,000 |
| වේතන | 206,800 |
| බොල් ණය | 17,000 |
| ගෙනයාමේ කුලී | 19,500 |
| විදුලිය ගාස්තු | 9,800 |
| ප්‍රචාරණය | 70,000 |
| මෝටර් රථ ක්ෂය | 130,000 |
| ලී බඩු ක්ෂය | 12,220 |
| වරිපනම් | 23,000 |
| මෝටර් රථ ධාවන වියදම් | 48,600 |
| ලැබූ ගෙවල් කුලී | 14,000 |
| ආයෝජන ආදායම් | 6,800 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව | 6,200 |
| දුන් වට්ටම් | 10,000 |
| බැංකු ගාස්තු | 5,600 |

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

## Statement of Financial Position

ව්‍යාපාරයක යම් නිශ්චිත දිනකට මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ලෙස හැඳින්විය හැකිය. මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව සමීකරණය මත පදනම්වය.

වත්කම් = හිමිකම් + වගකීම්

Assets = Equity + Liability

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd 

## .................. ව්‍යාපාරයේ
## 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **වත්කම්** | (රු. වලින්) | | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | **පිරිවැය** | **සමු(Ëය** | **ධාරණ අගය** |
| ඉඩම් | XXX | - | XXX |
| ගොඩනැගිලි | XXX | XXX | XXX |
| යන්ත්‍ර සුත්‍ර | XXX | XXX | XXX |
| මෝටර් රථ | XXX | XXX | XXX |
| ලී බඩු උපකරණ | XXX | XXX | XXX |
| | XXX | XXX | XXX |
| ස්වාධිකාරය | | XXX | |
| ආයෝජන | | XXX | XXX |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොගය | | XXX | |
| ණයගැතියෝ | XXX | | |
| **අඩු කළා:** | | | |
| අඩමාන ණය වෙන් කිරීම | (XX) | XXX | |
| ඉදිරියට කළ ගෙවීම් | | XXX | |
| බැංකු ශේෂය | | XXX | |
| මුදල් ශේෂය | | XXX | XXX |
| **මුළු වත්කම්** | | | XXX |
| හිමිකම සහ වගකීම | | | |
| හිමිකම | | | |
| ප්‍රාග්ධනය | | | XXX |
| (+) ශුද්ධ ලාභය | | | XX |
| | | | XXX |
| (-) ගැනිලි | | | (XX) |
| | | | XXX |
| **ජංගම නොවන වගකීම්** | | | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | | |
|---|---|---|---|
| බැංකු ණය | | XXX | |
| උකස් ණය | | XXX | XXX |
| | | | |
| ජංගම වගකීම් | | | |
| ණය හිමියෝ | | XXX | |
| උපචිත වියදම් | | XXX | |
| බැංකු අයිරාව | | XXX | XXX |
| මුළු හිමිකම සහ වගකීම් | | | XXX |

## උදාහරණ

පහත දැක්වෙන්නේ සේනාරත්න මහතාගේ ව්‍යාපාරයේ පොත් වලින් 2018 දෙසැම්බර් 31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුමයි.

| | රු( | රු( |
|---|---|---|
| බඩු තොගය (2018.01.01) | 200,000 | |
| ගැණුම් | 1,050,000 | |
| ආපසු යැවුම් | | 15,000 |
| ගෙන ඒමේ වාහන කුලී | 150,000 | |
| විකුණුම් | | 1,880,000 |
| ආපසු එවුම් | 40,000 | |
| කඩ කුලී හා වරිපනම් | 50,000 | |
| විදුලිය ගාස්තු | 38,000 | |
| වැටුප් හා වේතන | 200,000 | |
| විගණන ගාස්තු | 32,000 | |
| ප්‍රචාරණය | 100,000 | |
| දුන් වට්ටම් | 15,000 | |
| බොල් ණය | 24,000 | |
| ණය පොළී | 40,000 | |
| ලැබූ වට්ටම් | | 25,000 |
| විවිධ ආදායම් | | 12,000 |
| ආයෝජන ආදායම් | | 48,000 |
| ගැනිලි | 88,000 | |
| ගෙවූ ආදායම් බදු | 36,000 | |
| බැංකු ණය | | 400,000 |
| ණය හිමියෝ | | 105,000 |
| ගෙවිය යුතු විනිමය බිල්පත් | | 80,000 |
| උපචිත වියදම් | | 60,000 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| බැංකු අයිරාව (සම්පත් බැංකුව) | | 10,000 |
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැයට) | 1,400,000 | |
| මෙටර් රථ වාහන (පිරිවැයට) | 450,000 | |
| යන්ත්‍ර උපකරණ (පිරිවැයට) | 550,000 | |
| මොටර් වාහන ක්ෂය වෙන් කිරීම | | 50,000 |
| යන්ත්‍ර උපකරණ ක්ෂය වෙන්කිරීම | | 140,000 |
| අඩමාණ ණය වෙන්කිරීම (2018.12.31) | | 1,000 |
| ආයෝජන | 275,000 | |
| ණය ගැතියෝ | 250,000 | |
| ලැබිය යුතු විනිමය බිල්පත්‍ර | 50,000 | |
| කලින් ගෙවූ වියදම් | 40,000 | |
| බැංකු ශේෂය (සෙලාන් බැංකුව) | 180,000 | |
| අතැති මුදල් | 43,000 | |
| සුළු මුදල් | 12,000 | |
| ගොඩනැගිලි අලුත්වැඩියාව | 33,000 | |
| ස්වාධිකාරය හා ලිපි හිමිකම් | 50,000 | |
| උකස් ණය | | 70,000 |
| ප්‍රාග්ධනය | | 2,500,000 |
| | 5,396,000 | 5,396,000 |

2018.12.31 දිනට ඉතිරි බඩු තොගය රුඃ 235,000 ක් ලෙස සලකන්න.

ඉහත ශේෂය ඇසුරින් 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයද එදිනට මූල්‍ය

### උදාහරණ

තනි වෙළෙන්දෙනකු වූ ශාන්තගේ පොත් වලින් පහත සඳහන් ශේෂ පිරික්සුම 2018.03.31 දින උපුටා ගන්නා ලදී.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | 80,270 |
| තොගය (2017.04.01) | 14,930 | |
| ලී බඩු සවිකිරීම | 7,350 | |
| වෑන් රථය (ගත්මිලට) | 59,000 | |
| ගැණුම් | 78,200 | |
| ගෙන ඒමේ කුලී | 1,550 | |
| විකුණුම් | | 119,305 |
| ආපසු යැවුම් | | 3,750 |
| ණය ගැතියෝ හා ණය හිමියෝ | 7,800 | 5,220 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| බොල් ණය | 380 | |
| ආපසු එවුම් | 2,200 | |
| අඩමාණ ණය වෙන්කිරීම 2017.04.01 | | 180 |
| වේතන | 8,160 | |
| දුන්වට්ටම් හා ලැබූ වට්ටම් | 1,415 | 890 |
| බැංකුවේ ශේෂය | 1,835 | |
| රÏණය | 1,800 | |
| ගැනිලි | 2,200 | |
| බැංකු ණය | | 15,000 |
| වෑන් රථ වියදම් | 660 | |
| ගෙවල් කුලී හා වරිපනම් | 640 | |
| ගමන් වියදම් | 1,500 | |
| ප්‍රචාරණය | 6,400 | |
| යන්ත්‍රෝපකරණ | 27,000 | |
| Ëය සඳහා වෙන් කිරීම | | |
| - ලී බඩු සවිකිරීම | | 1,250 |
| - වෑන් රථය | | 6,000 |
| ලද කොමිස් | | 300 |
| පොදු වියදම් | 6,845 | |
| වෑන් රථ අලුත් වැඩියා වියදම් | 2,300 | |
| | **232,165** | **232,165** |

පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගෙන 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුමද එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයද පිළියෙල කරන්න.

1) 2017.03.31 දිනට තොගය රු. 18,685
2) ලැබිය යුතු ආයෝජන ආදායම රු. 800 කි.
3) කොමිස් වලින් රු. 100 ක් ඉදිරි වර්ෂය සඳහා වේ.
4) බැංකු ණය සඳහා වාර්ෂික පොළිය රු. 1,500 පොත්වල සටහන් වී නැත.
5) උපචිත ගෙවල් කුලිය රු. 260 කි.
6) ඉදිරියට ගෙවූ රක්ෂණය රු. 200 කි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ

උදය තනි වෙළෙන්දෙකි. 2018.12.31 දිනට වූ පහත සඳහන් ශේෂ පිරික්සුම ඔහුගේ පොත් වලින් උපුටා ගෙන ඇත.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | 713,500 |
| විකුණුම් | | 715,500 |
| ගෙන ඒමේ කුලී | 14,000 | |
| ආපසු එවුම් සහ ආපසු යැවුම් | 37,000 | 28,500 |
| ගෙවල් කුලී | 20,000 | |
| ගැණුම් | 334,500 | |
| තොගය 2018.01.01 | 81,500 | |
| දුන්වට්ටම් හා ලද වට්ටම් | 13,500 | 2,500 |
| වේතන | 120,000 | |
| තැපැල් හා දුරකථන ගාස්තු | 4,750 | |
| ලිපිද්‍රව්‍ය | 1,600 | |
| බොල් ණය | 4,900 | |
| අඩමාන ණය වෙන්කිරීම (2018.01.01) | | 6,000 |
| ලීබඩු සවිකිරීම් (පිරිවැයට) | 85,000 | |
| ගමන් වියදම් | 7,600 | |
| රක්‍ෂණ ගාස්තු | 4,000 | |
| බැංකු ගාස්තු | 1,700 | |
| ණයගැතියෝ සහ ණයහිමියෝ | 96,000 | 79,000 |
| ගැනිලි | 40,000 | |
| ප්‍රචාරණ වියදම් | 28,000 | |
| වෑන්රථ අලුත්වැඩියාව | 19,500 | |
| බැංකු ශේෂය | 24,700 | |
| වෑන් රථය (පිරිවැයට) | 650,000 | |
| ස්ථාවර තැන්පතු (ජාතික ඉතිරි කිරීමේ බැංකුව) | 100,000 | |
| ක්‍ෂය සඳහා වෙන්කිරීම 2018.01.01 | | |
| ලීබඩු හා සවිකිරීම් | | 12,750 |
| වෑන් රථ | | 130,000 |
| | **1,688,250** | **1,688,250** |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගෙන 2018 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුම එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයද පිළියෙල කරන්න.

1) 2018.12.31 දින තොගය රු: 71,200.
2) 2018 වර්ෂයේ අවසාන මාස දෙකේ ගෙවල් කුලී වශයෙන් රු: 4,000 ක් ගෙවා නැත.
3) අඩමාන ණය වෙන්කිරීම තව රු: 3,600 කින් වැඩි කරන්න.
4) රක්ෂණ ගාස්තු වලින් රු: 2,000 ක් ඉදිරි වර්ෂය සඳහාය.
5) ලීබඩු සවිකිරීම් 5% බැගින් ද වෑන් රථ 20% බැගින් ද පිරිවැය මත ක්ෂය කරන්න.
6) ස්ථාවර තැන්පතු සඳහා පොළී අනුපාතිකය 15% කි 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පොළී ලැබී නැත.
7) ප්‍රචාරණ වියදම් 20% ක් ඉදිරියට ගෙන යන්න.
8) වර්ෂ අවසානයේ ලිපිද්‍රව්‍ය සඳහා තව රු: 600 ක් හා වෑන් රථ අලුත්වැඩියා සඳහා රු: 500 ක් ගෙවිය යුතුව ඇත.

### උදාහරණ

තනි පුද්ගල ව්‍යාපාරිකයෙක් වූ රන්වැලි එන්ටප්‍රයිසස් හි පොත් වලින් 2018 මාර්තු 31 දිනට උපුටාගත් ශේෂයන් පහත දී ඇත.

| | හර<br>රු. '000 | බැර<br>රු. '000 |
|---|---|---|
| විකුණුම් | - | 8,000 |
| 2017.04.01 දිනට තොග | 320 | - |
| ගැණුම් | 5,200 | - |
| ගෙන ඒමේ කුලි | 320 | - |
| කාර්ය මණ්ඩල වැටුප් | 640 | - |
| ගැනිලි - රන්මල් | 400 | - |
| බොල් ණය | 40 | - |
| 2017.04.01 දිනට අඩමාන ණය සඳහා වෙන් කිරීම | - | 24 |
| බැංකු ගාස්තු | 56 | - |
| බැංකු ණය පොළී (2017.12.31 දක්වා ගෙවා ඇත) | 72 | - |
| විකුණුම් කොමිස් | 160 | - |
| බෙදාහැරීමේ වියදම් | 120 | - |
| ලැබුන ගෙවල් කුලී ආදායම | - | 165 |
| පරිපාලන වියදම් | 184 | - |
| 12% බැංකු ණය මුදල | - | 800 |
| ලද වට්ටම් | - | 83 |
| වෙළෙඳ ලැබිය යුතු ගිණුම් | 184 | - |
| වෙළෙඳ ගෙවිය යුතු ගිණුම් | - | 280 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| ඉඩම් පිරිවැයට | 2,000 | - |
| ගොඩනැගිලි පිරිවැයට | 1,600 | - |
| බෙදාහැරීමේ වාහන - පිරිවැයට | 960 | - |
| කාර්යාල උපකරණ - පිරිවැයට | 800 | - |
| 2017.04.01 දිනට සමුච්චිත ක්ෂයවීම් | - | - |
| - ගොඩනැගිලි | - | 200 |
| - බෙදාහැරීමේ වාහන | - | 504 |
| - කාර්යාල උපකරණ | - | 240 |
| අත ඉතිරි මුදල් | 245 | - |
| ප්‍රාග්ධන ගිණුම - රන්මල් | | 3,005 |
| | **13,301** | **13,301** |

පහත සඳහන් අමතර තොරතුරු දී ඇත.

(1) 2018.03.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 240,000/- කි. මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම රු. 280,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(2) 2018.03.31 දිනට ඉදිරියට ගෙවීම් පහත සඳහන් පරිදි වේ.

| | ඉදිරියට ගෙවීම් රු. |
|---|---|
| බෙදාහැරීමේ වියදම් | 5,000 |
| පරිපාලන වියදම් | 8,000 |

(3) 2018මාර්තු මාසය සඳහා රු. 2,000/- ක් වූ විදුලි බිල්පත 2018 අප්‍රේල් මාසයේ දී ගෙවන ලදී. වර්ෂය තුළ විදුලිය සඳහා ගෙවන ලද වියදම් පරිපාලන වියදම්වල ඇතුලත් ය.

(4) ව්‍යාපාරයට අයත් ගොඩනැගිල්ලේ කොටසක් 2016 වර්ෂයේ සිට වර්ෂ 5 ක කාලයක් සඳහා මසකට රු. 15,000/- බැගින් කුලියට දී තිබුණි.

(5) තවත් රු. 4,000/- ක් බොල් ණය සේ ලියාහැරිය යුතු අතර අඩමාණ ණය සඳහා වෙන් කිරීම ඉතිරි වෙළෙඳ ලැබිය යුතු ගිණුම් වලින් 10% ක් වන සේ ගැලපිය යුතුය.

(6) කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අළුත් උපකරණ මිලදී ගැනීම සඳහා 2018.01.01 දින රු.400,000/- ක් වැය කරන ලදී. කෙසේ වුවද එය ගැණුම් ලෙස සටහන් කර තිබුණි. කාර්යාල උපකරණ හීනවන ශේෂ ක්‍රමය යටතේ වර්ෂයකට 20% බැගින් ක්ෂය කෙරේ.

(7) ගොඩනැගිලි හා මෝටර්වාහන ඒවායේ පිරිවැය මත පිළිවෙලින් වර්ෂයකට 5% සහ 20% බැගින් ක්ෂය කරනු ලැබේ.

ඉහත සඳහන් තොරතුරු උපයෝගි කරගෙන, රන්වැලි එන්ටප්‍රයිසස් සඳහා ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතු ය.

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ලකුණු 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 10)

(මුළු ලකුණු 20)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### උදාහරණ

බුල්ලා තනි පුද්ගල ව්‍යාපාරිකයෙකි. පහත සඳහන් ශේෂ පිරික්සුම 2018 මාර්තු 31 දින ව්‍යාපාර කටයුතු අවසාන වීමෙන් පසු ඔහුගේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | හර<br>රු. '000 | බැර<br>රු. '000 |
|---|---:|---:|
| ගැණුම් | 7,620 | |
| විකුණුම් | | 13,990 |
| 2017.04.01 දිනට තොගය | 1,720 | |
| බුල්ලාගේ ප්‍රාග්ධනය | | 2,820 |
| බැංකු අයිරාව | | 1,450 |
| අතැති මුදල් | 630 | |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 480 | 310 |
| විකුණුම් ආපසු එවුම් | 270 | |
| ගැණුම් ආපසු යැවුම් | | 190 |
| විකුණුම් වියදම | 720 | |
| ගෙවල් කුලි, වරිපනම් හා රක්‍ෂණ | 580 | |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම - 201.04.01 දිනට | | 120 |
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩම් වටිනාකම රු. 1,200,000/- කි) | 2,000 | |
| 201.04.01 දිනට ගොඩනැගිලි සඳහා ක්‍ෂය වෙන් කිරීම | | 60 |
| ලි බඩු හා සවි කිරීම පිරිවැයට | 800 | |
| 2017.04.01 දිනට ක්‍ෂය වෙන් කිරීම | | 240 |
| බෙදාහැරීමේ වෑන් රථ පිරිවැයට | 1,700 | |
| 2017.04.01 දිනට ක්‍ෂය වෙන් කිරීම | | 700 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,970 | 1,120 |
| බොල් ණය ලියා හැරීම් | 70 | |
| ගැනිලි | 960 | |
| වැටුප් හා වේතන | 1,980 | |
| විදුලිය හා ජලය | 80 | |
| 12 % බැංකු ණය මුදල (2016.03.31 දින ලබාගත්) | | 1,500 |
| ස්ථාවර තැන්පතු | 500 | |
| බෙදාහැරීමේ වෑන් රථය - ධාවන ගාස්තු | 420 | |
| | 22,500 | 22,500 |

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අමතර තොරතුරු සපයා ඇත.

(1) 2018.03.31 දිනට තොගයේ පිරිවැය රු. 1,460,000/- ක් වූ අතර, එහි උපලබ්ධි අගය පිරිවැයට වඩා 10% කින් වැඩි බවට ඇස්තමේන්තු කර ඇත.

(2) 2017.11.30 දින පිරිවැය රු. 20,000/- ක් වූ තොග ගින්නකින් හානියට පත් විය. මේ සම්බන්ධයෙන් සටහන් තබා නැත.

(3) 2018.03.31 දිනට වූ උපචිත වැටුප් හා වේතන රු. 70,000/- කි.

(4) 2018.03.31 දිනට ඉදිරියට ගෙවූ ගෙවල් කුලී රු. 60,000/- කි.

(5) දේපළ, පිරියත හා උපකරණ හීන වන ශේෂ ක්‍රමය මත පහත සඳහන් අනුපාත වලට ක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ලී බඩු හා සවිකිරීම් | වාර්ෂිකව | 10% බැගින් |
| බොදාහැරීමේ වෑන් රථ | වාර්ෂිකව | 25% බැගින් |
| ගොඩනැගිලි | වාර්ෂිකව | 5% බැගින් |

(6) ඉකුත් වර්ෂයේදී බොල් ණය වශයෙන් කපා හරින ලද රු. 20,000/- ක ණයක් වර්ෂය තුල අය කර ගනු ලැබු අතර, එය ණයගැති (වෙළෙඳ ලැබිය යුතු ගිණුම්) ගිණුමට බැර කරන ලදී.

(7) රු. 10,000/- ක ණයක් බොල් ණය ලෙස ලියා හැරිය යුතු අතර, ඉතිරි ණයගැතියන්ගෙන් (වෙළෙඳ ලැබිය යුතු ගිණුම්) 5% ක් වන සේ අඩමාන ණය සඳහා වෙන් කිරීමක් කළ යුතුය.

(8) 2018.03.31 දින තෙක් ඉපයු රු. 38,000/- ක ස්ථාවර තැන්පත් පොලි සඳහා ගිණුම් තැබීම කළ යුතුය.

ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන, ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **බුල්ලාගේ** ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය

**(ලකුණු** 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු** 10)

**(මුළු ලකුණු** 20)

### උදාහරණ

පහත සඳහන් සාරාංශගත ශේෂ පිරික්සුම තනි ව්‍යාපාරික ගුණදාස ට්‍රේඩර්ස් හි පොත් වලින් 2018 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදී.

| | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| පිරිවැටුම් (විකුණුම්) | | 5,511,000 |
| දේපල, පිරියත හා උපකරණ | | |
| ඉඩම් | 1,500,000 | |
| ගොඩනැගිලි පිරිවැයට | 1,560,000 | |
| ලී බඩු හා සවිකිරීමේ පිරිවැයට | 690,000 | |
| මෝටර් වාහන පිරිවැයට | 1,530,000 | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| ක්ෂය සඳහා වෙන් කිරීම් - 2017.04.01 දිනට | | |
| ගොඩනැගිලි | | 480,000 |
| ලී බඩු හා සවිකිරීම් | | 210,000 |
| මෝටර් වාහන | | 355,000 |
| ලැබිය යුතු ගිණුම්/ ගෙවිය යුතු ගිණුම් (වෙළෙඳ) | 450,000 | 467,500 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් - 2017.04.01 දිනට | | 36,000 |
| බැංකුවේ මුදල් | 204,000 | |
| අතැති මුදල් | 87,300 | |
| ප්‍රාග්ධන ගිණුම - ගුණදාස | | 3,451,000 |
| 13.5% බැගින් වූ ස්ථාවර තැන්පතු - ගාල්ල බැංකුව | 300,000 | |
| බඩු තොග - 2017.04.01 දිනට | 228,000 | |
| ගැණුම් | 2,679,000 | |
| පරිපාලන ආයතන වියදම් | 459,000 | |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 537,000 | |
| මූල්‍ය වියදම් | 141,200 | |
| අයිතිකරුගේ මුදල් ගැනිලි | 125,000 | |
| | **10,490,500** | **10,490,500** |

පහත අමතර තොරතුරු ඔබට සපයා ඇත.

(1) 2018.03.31 දිනට වූ බඩු තොග පිරිවැයට රු. 420,000 කට අගය කර ඇත. මෙම මුළු බඩු තොගය 2018.03.31 දින රු. 480,000 කට විකුණාගත හැකිව තිබුණි.

(2) 2018.03.31 දිනට වෙළෙඳ ණයගැතියෙකුගෙන් අය විය යුතුව ඇති රු. 21,000 ක මුදලක් තවදුරටත් අය කර ගත නොහැකි බව හඳුනාගෙන ඇති බැවින් එම මුදල කපා හල යුතුය. අඩමාන ණය වෙන් කිරීම ලැබිය යුතු වෙළෙඳ ගිණුම් වලින් 5% ක් ලෙසට ගැලපුම් කළ යුතුවේ.

(3) වසර තුළ ආයතනය රු. 150,000 ක ලී බඩු මිලට ගෙන නිසියාකාරව ගිණුම් ගත කර ඇත. පහත ප්‍රමාණ අනුව පිරිවැය මත ක්ෂය වෙන් කිරීම කළ යුතුය.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසරකට 5% |
| ලී බඩු හා උපකරණ | වසරකට 20% |
| මෝටර් වාහන | වසරකට 25% |

මිලදී ගත් වර්ෂයේ දී මුළු වසර වෙනුවෙන්ම ක්ෂය කරනු ලබන අතර බැහැර කරන වර්ෂයේ දී ක්ෂය කරනු නොලැබේ.

(4) 2018 මාර්තු 31 දිනට උපචිත විදුලිය, දුරකතන හා ජල ගාස්තු පිළිවෙලින් රු. 9,000/-, රු. 2,600/- සහ රු. 900/- විය.

(5) ගණුදෙනුකරු අමල්ට රු. 9,000/- ක ණයට විකිණීමක් ගිණුම්වලට ගෙන නැත.

(6) ගුණදාස විසින් ඔහුගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලද පිරිවැය රු. 15,000/- ක බඩු තොගය පිළිබඳව ගිණුම්ගත වී නැත.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

(7) ගාල්ල බැංකුවෙහි ස්ථාවර තැන්පතුව 2017.09.30 දින කර තිබූ අතර, 2018.03.31 දිනට උපචිත පොලිය සඳහා ප්‍රතිපාදන ඇතුලත් කළ යුතුය.

ඔබ විසින්, ගුණදාස ට්‍රේඩර්ස් හි පහත සඳහන් දෑ පිළියෙල කළ යුතු වේ.

(a) 2018 මාර්තු 31 න් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය **(ලකුණු** 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු** 10)

**(මුළු ලකුණු** 20)

## උදාහරණ

තනි පුද්ගල ව්‍යාපාරයක් වූ **ඩියුක් ට්‍රේඩින් හවුස් හි** පොත්වලින් 2018 මාර්තු 31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර<br>රු. '000 | බැර<br>රු. '000 |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (ඉඩමේ අගය රු. 1,500,000/- කි) | 5,100 | |
| ලී බඩු හා සවිකිරීම් | 2,000 | |
| මෝටර් වාහන | 4,400 | |
| 2017.04.01 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම් | | |
| ගොඩනැගිලි | | 1,050 |
| ලි බඩු හා සවිකිරීම් | | 870 |
| මෝටර් වාහන | | 1,530 |
| ලැබිය යුතු ගිණුම් - වෙළෙඳ | 900 | |
| ගෙවිය යුතු ගිණුම් - වෙළෙඳ | | 850 |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 60 | 90 |
| ප්‍රවාහන වියදම් | 284 | |
| විදුලි වියදම් | 42 | |
| මෝටර් වාහන ධාවන වියදම් | 90 | |
| වරිපනම් | 66 | |
| රක්ෂණ | 54 | |
| කාර්යාල වියදම් | 126 | |
| වැටුප් හා වේතන | 459 | |
| පොදු වියදම් | 205 | |
| ප්‍රචාරණ වියදම් | 147 | |
| විකුණුම් (පිරිවැටුම) | | 7,400 |
| විකුණුම් වල පිරිවැය | 3,390 | |
| බැංකු අයිරා පොළී | 41 | |
| 16% ණය මුදල | | 2,550 |
| 2018.03.31 දිනට බඩු තොග | 840 | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---:|---:|
| බැංකු අයිරාව | | 1,296 |
| අතැති මුදල් | 189 | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 21 |
| ඩියුක්ගේ ප්‍රාග්ධනය | | 2,736 |
| | **18,393** | **18,393** |

පහත දැක්වෙන අමතර තොරතුරු සපයා ඇත.

(1) රු. 15,000/- ක් පිරිවැය වූ තොග පරිත්‍යාගයක් ලෙස නිකුත් කර ඇතත්, එය ගිණුම්ගත කර නොමැත.

(2) අයිතිකරු වන ඩියුක්, තම පුතාගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබාගත් රු. 37,000/- ක මුදල, කාර්යාල වියදම් යටතේ සටහන් කර ඇත.

(3) ලැබිය යුතු වෙළෙඳ ගිණුමක් වෙනුවෙන් (වෙළෙඳ ණයගැතියකුගෙන්) ලැබිය යුතු රු. 20,000/- ක මුදල අයකර ගත නොහැකි බැවින් එය බොල් ණයක් සේ කපා හල යුතුය. අඩමාන ණය සඳහා වූ වෙන් කිරීම ලැබිය යුතු වෙළෙඳ ගිණුම් ශේෂයෙන් 5% ක් වන සේ ගැලපිය යුතුය.

(4) 2018 මාර්තු 31 දිනට කලින් ගෙවීම් සහ උපචිත වියදම් පහත සඳහන් පරිදි වේ.

| | රු( | රු( |
|---|---:|---:|
| උපචිත විදුලිය ගාස්තු | | 23,000 |
| උපචිත ප්‍රවාහන ගාස්තු | | 24,000 |
| උපචිත වරිපනම් | | 12,000 |
| කලින් ගෙවූ ප්‍රචාරණ වියදම් | 18,000 | |
| කලින් ගෙවූ රක්ෂණ වියදම් | 24,000 | |

(5) පිරිවැය මත, පහත අනුපාත පදනම් කර ගනිමින්, සරල මාර්ගික ක්‍රමය යටතේ, සත්‍ය වශයෙන් පාවිච්චි කළ කාලය පදනම් කර, ක්ෂය සඳහා වෙන් කිරීම් කළ යුතුය.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% වාර්ෂිකව |
| ලී බඩු සහ සවිකිරීම් | 20% වාර්ෂිකව |
| මෝටර් වාහන | 25% වාර්ෂිකව |

(6) ණය මුදල, 2017/10/01 දින ලබාගෙන ඇති අතර, ඒ සඳහා පොලී වෙන් කළ යුතුය.

(7) අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු. 47,000/- ක් සැපයුම්කරුවෙකුට ගෙවා ඇතත්, ඒ සම්බන්ධයෙන් ගිණුම් සටහන් තබා නොමැත.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

උක්ත තොරතුරු පදනම් කරගෙන, ඔබ විසින්, පහත දෑ පිළියෙල කළ යුතුය.

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඩියුක් ට්‍රේඩින් හවුස් හි ආදායම් ප්‍රකාශය **(ලකුණු 10)**

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

## උදාහරණ

**ටිකිරි ට්‍රේඩර්ස්** හි පොත් තබන්නා විසින් එහි පොත්වලින් 2018 මාර්තු 31 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහතාකාර වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| බැංකු පොළිය | 23,500 | |
| ප්‍රාග්ධනය | | 4,230,000 |
| බැංකු ශේෂය | | 78,500 |
| පරිගණක | 54,500 | |
| විකුණුම්වල පිරිවැය | 44,550,000 | |
| දුන් වට්ටම්/ ලද වට්ටම් | 13,500 | 33,500 |
| වෑන් රථ පැහැර කිරීම් | | 1,200,000 |
| ගැනිලි | 455,000 | |
| විදුලිය | 45,500 | |
| වියදම් ණයහිමියෝ | | 34,500 |
| බැංකු ස්ථාවර තැන්පතු | 6.050,000 | |
| නිදහස් ඉඩම් | 2,100,000 | |
| ලී බඩු සහ උපකරණ | 123,500 | |
| රක්‍ෂණ | 34,500 | |
| ලද පොළී | | 665,500 |
| මෝටර් රථ අලුත්වැඩියා | 39,500 | |
| මෝටර් වාහන | 2,235,500 | |
| 2017.04.01 දිනට බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 12,300 |
| ක්‍ෂය සඳහා වෙන් කිරීම් | | 1,234,500 |
| ගෙවල් කුලී | 198,000 | |
| ලද ගෙවල් කුලී | | 35,000 |
| වැටුප් සහ වේතන | 567,800 | |
| විකුණුම් | | 50,750,000 |
| විකුණුම් ආපසු එවුම් | 45,000 | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| මුද්දර බදු (Duty) සහ නීති ගාස්තු | 181,700 | |
| 2018.03.31 දිනට බඩු තොගය | 678,000 | |
| දුරකථන | 345,000 | |
| ගෙවිය යුතු ගිණුම් (වෙළඳ ණයහිමියෝ) | | 454,200 |
| ලැබිය යුතු ගිණුම් (වෙළඳ ණයගැතියෝ) | 987,500 | |
| | **58,726,000** | **58,726,000** |

ඔබට පහත සඳහන් තොරතුරු සපයා ඇත.

(1) අයිතිකරු තම පුද්ගලික පරිහරණයට ලබාගත් භාණ්ඩවල අගය රු. 23,500 ක් වේ.

(2) මුද්දර බදු සහ නීති ගාස්තු ගෙවනු ලැබ ඇත්තේ වර්ෂය තුළදී මිලදී ගත් නිදහස් ඉඩම් වෙනුවෙනි.

(3) ව්‍යාපාරය කුලියට ලබාගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර, එහි මාසික කුලිය රු. 18,000 කි. 2018 මාර්තු සඳහා වූ කුලිය ගෙවා නොතිබුණි.

(4) කුලියට ලබාගත් ගොඩනැගිල්ලෙන් කොටසක් 2017 ඔක්තෝබර් මස 01 දින සිට සමාගම විසින් රු. 5,000 ක මාසික කුලියකට නැවත කුලියට දී (මඉ-කැව) ඇත.

(5) 2017/04/01 දින ක්ෂය වෙන් කිරීම්වල සංයුතිය පහතාකාර වේ.

| | රු. |
|---|---|
| ▪ මෝටර් වාහන | 1,200,000 |
| ▪ ලී බඩු හා උපකරණ | 30,000 |
| ▪ පරිගණක | 4,500 |

(6) සමාගම විසින් දේපල, පිරියත සහ උපකරණ හීනවන ශේෂ ක්‍රමයට පහත දැක්වෙන ප්‍රතිශත මත ක්ෂය කරනු ලැබේ. මිලදී ගන්නා වසර සඳහා ක්ෂය කිරීම් නොකරන අතර, බැහැර කරන වර්ෂය සඳහා මුළු වසර වෙනුවෙන්ම ක්ෂය කිරීම් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ▪ මෝටර් වාහන | වර්ෂයකට | 20% බැගින් |
| ▪ ලී බඩු හා උපකරණ | වර්ෂයකට | 20% බැගින් |
| ▪ පරිගණක | වර්ෂයකට | 20% බැගින් |

(7) අඩමාන ණය වෙන් කිරීම (වෙළඳ ණයගැතියන්) ලැබිය යුතු ගිණුම්වලින් 8% ක් ලෙස ගැලපිය යුතුය.

**ඔබ විසින් පහත දෑ සකස් කළ යුතුය.**

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය **(ලකුණු** 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු** 10)

**(මුළු ලකුණු** 20)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### උදාහරණ

රාම් ට්‍රේඩර්හි පොත්වලින් 2018 මාර්තු 31 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| බොල් ණය | 17,700 | |
| බැංකු අයිරාව | | 543,200 |
| බැංකු පොළිය | 54,900 | |
| ගොඩනැගිලි රක්ෂණය | 15,000 | |
| ප්‍රාග්ධන ගිණුම | | 2,578,450 |
| ගෙන ඒමේ කුලී | 135,000 | |
| කොමිස් | 18,900 | |
| ලද කොමිස් | | 4,500 |
| ගෙවිය යුතු ගිණුම් (ණයහිමියෝ) | | 199,600 |
| ලද වට්ටම් | | 73,000 |
| ගැනිලි | 543,000 | |
| විදුලිය | 435,900 | |
| ස්ථාවර තැන්පතු | 250,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,600,000 | |
| මෝටර් වාහන | 1,900,000 | |
| මෝටර් වාහන රක්ෂණය | 73,500 | |
| මෝටර් වාහන නඩත්තු | 159,600 | |
| මෝටර් වාහන ක්ෂය වෙන් කිරීම - 2017.04.01 දිනට | | 380,000 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් - 2017.04.01 දිනට | | 10,800 |
| ගැණුම් | 2,999,950 | |
| වරිපනම් | 9,600 | |
| ලද ගෙවල් කුලී | | 24,000 |
| වැටුප් හා වේතන | 288,000 | |
| විකුණුම් | | 5,659,000 |
| විකුණුම් ආපසු එවුම් | 36,000 | |
| බඩු තොග - 2017.04.01 දිනට | 677,500 | |
| විවිධ වියදම් | 18,000 | |
| ලැබිය යුතු ගිණුම් (ණයගැතියෝ) | 240,000 | |
| | **9,472,550** | **9,472,550** |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

පහත සඳහන් අමතර තොරතුරු සපයා ඇත.

(1) 2018 මාර්තු 31 දිනට වූ බඩුතොගය රු. 989,500 කට අගය කර ඇත.

(2) අඩමාන ණය සඳහා වෙන් කිරීම වර්ෂාවසාන ලැබිය යුතු ගිණුම් (ණයගැතියෝ) ශේෂයෙන් 6% ක් විය යුතුය.

(3) ගොඩනැගිල්ලෙන් කොටසක් 2017 ජනවාරි 01 දින සිට වර්ෂයක කාලයක් සඳහා මසකට රු. 2,000 ක් බැගින් කුලියට දෙන ලදී.

(4) නිශ්චිත ශේෂ ක්‍රමයට වර්ෂයකට 20% බැගින් මෝටර් වාහන ක්ෂය කළ යුතුය.

(5) රු. 345,600 ක් පිරිවැය වූ වෙළඳ භාණ්ඩ, හිමිකරු විසින් පුද්ගලික පරිහරනයට ගෙන ඇත.

(6) 2018.01.01 සිට 2018/03/31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු. 3,600 ක වරිපනම් ගෙවිය යුතුව ඇත.

(7) ස්ථාවර තැන්පතු සඳහා ලද රු. 5,000 ක පොලිය වැරදීමකින් විකුණුම් ගිණුමට බැර කර ඇත.

(8) 2018 පෙබරවාරි සහ මාර්තු මස සඳහා වූ රු. 73,500 ක විදුලි බිල් වසර තුලදී ගෙවා නොමැත.

ඔබ විසින් පහත දෑ සකස් කළ යුතුය.

(a) 2018 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

(b) 2018 මාර්තු 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd